# 4 ශ්‍රේණිය සිංහල ගුරු අත් පොතට වැඩ පොත - අංක 03

## R 1, W 1 නිපුණතා ආවරණය - 2021

Part 02



- අවබෝධයෙන් ප්‍රතිචාර කියවීමේ කුසලතා ප්‍රදර්ශනය සඳහා ශබ්ද නගා නිවැරදි ව කියවයි.
- ශබ්ද නගා, හැඟීම් ප්‍රකාශ වන පරිදි කියවීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
- නිශ්ශබ්ද ව කියවීමේ හුරුව ලබයි.
- විරාම ලක්ෂණ පිළිබඳ ව සැලකිලිමත් ව එහි භාවිතය ප්‍රදර්ශනය කරයි.
- වචන අතර පරතරය තබමින් නිවැරදි ව වාක්‍ය ලියයි.
- අර්ථය පැහැදිලි වන පරිදි සරල වාක්‍ය ලියයි.

**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**

(Dip. In Sci. N.I.E./O.U.S.L.)

For Online Class details WhatsApp 071-9020298

10. ජේදය කියවා 'ද' අකුරෙන් පටන් ගන්නා වචන සහ ද අකුරට පිළි යෙදුණු වචන සොයා ලියන්න. ඒවායේ ශබ්ද සහ පිල්ලම නම් කරන්න.

නිවාඩුව එළඹෙන තෙක් දර්ශන බලා සිටියේ අත්තම්මාගේ දානේ ගෙදර යාමට ය. අත්තම්මලාගේ නිවස පිහිටා තිබුණේ දැකුම්කලු පරිසරයක ය. ගමේ පරිසරය දැකීමට අපේ දෑස් පින් කර ඇති බව තාත්තා කියයි. නිවස පිටුපසින් ගලා යන ඇළේ දිය නෑමට දර්ශන බෙහෙවින් ආසා කරයි. ගමේ දී දර්ශන සමඟ සෙල්ලම් කිරීමට දීපාල් ද එක් වෙයි. ගමේ සිට නගරයට පැමිණීමට ඇති ගමන් මඟ ඉතා දුෂ්කර ය. එහෙත් නගරයේ මෙන් ගමේ පරිසරය දූෂණය වී නැත. ගමේ පවතින නිසංසල බව අපගේ සිත් සතුටු කරවයි. ගමේ හා නගරයේ පවතින්නේ දෙආකාරයක දේශගුණ තත්ත්වයකි. ගමේ පවතින දේශගුණය නිසා ගස්වැල් පලින් බර වී තිබේ. දෛනික ව ආහාර සොයා එන කුරුල්ලන්ගේ කිචිබිචි නාදය පරිසරය තවත් අලංකාර කරයි. දහවල් කාලයේ දොළු කරා දිය නෑමට යන දර්ශන හා දීපාල් සවස් වන තුරු ම සෙල්ලම් කරති. දීපාල්ගේ මවගේ කටහඬෙහි දෝංකාරය ඇසෙත් ම දොළෙන් ගොඩ වීමට සිදුවන බව දෙදෙනා ම දනිති. මවගේ හඬට අවනත වන දරුවෝ රෑ බෝවන්නට පෙර නිවසට එති.

දර්ශන - ද - අ - පිල්ලමක් නැත. දානේ - දා - ආ - ඇලපිල්ල.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

11. ජේදය කියවා 'ල' අකුරෙන් පටන් ගන්නා වචන සහ ල අකුරට පිළි යෙදුණු වචන සොයා ලියන්න. ඒවායේ ශබ්ද සහ පිල්ලම නම් කරන්න.

පුංචි කඳුගැටයක් උඩ ලස්සන ම ලස්සන පුංචි ගෙයක් තිබුණා. මේ ගෙය හදලා තිබුණේ ලෑලිවලින්. ගෙදර තිබුණු බඩුමුට්ටුත් ලෑලිවලින්ම යි හදලා තිබුණේ. මේ පළාතට විදුලිය තිබුණේ නැහැ. ලාම්පු එළියෙන් තමයි රාත්‍රියට වැඩ කරන්නේ.

කන්ද පාමුල පුංචි විලක් තිබුණා. ඒ විලේ මානෙල් පිරිලා හිටියා. විල වටේ ම ලිලී මල් ගස්වල මල් පිරිලා හරි ම ලස්සන යි.

මේ ගෙදර ජීවත් වුණේ ආච්චි අම්මෙකුයි, දුවෙකුයි. ආච්චි අම්මා ලීලාවතී. පුංචි දුවගේ නම ලිලී. ආච්චි අම්මා කෑම වර්ග හදලා ඒවා විකුණලා තමයි ජීවත් වුණේ. ලැවරියා, ලුණු දෙහි, ලූනු බැදුම් හරි ම රසට හදලා බෝතල්වල දාලා නගරයට යවනවා. පුංචි ලිලී ලූනු ලෙලි ඇරලා සුද්ද කරලා දීලා ආච්චිට උදවු කළා. මේ කෑම නගරයට අරගෙන ගියේ ලයනල් කියලා මාමා කෙනෙක්. මාමා රැකියාව කළේ ලුණු ලේවායේ.

ටික කලක් ගත වුණා. ආච්චි අම්මා ලයනල් මාමාට කියලා හැම ඉරිදා ම ලොතරැයි ටිකට් එකක් ගෙන්වා ගත්තා. නගරයට ගියා ම ලයනල් මාමා ලොතරැයි දිනුම්වල අංක ආච්චිට ලියලා ගෙනවිත් දෙනවා. දවසක් දා ආච්චිගේ ටිකට් එකට ලොකු ම දිනුමක් ඇදිලා. ආච්චි ලොතරැයි මණ්ඩලයට ලිපියක් ලියලා ලයනල් මාමා අතට දුන්නා තැපැල් කරන්න. ලිපිය ලැබුණු හැටියේ ම ලොතරැයි මණ්ඩලයෙන් ලිලීගේ ගෙදර සොයාගෙන ආවා. ආච්චි අම්මාත්, ලිලීත් නගරයට එක්කරගෙන ගිහින් ලොතරැයි දිනුමේ මුදල් ලබා දුන්නා. ආච්චි අම්මා කැම හදන ව්‍යාපාරය තව දියුණු කර ගත්තා. ලයනල් මාමාටත් මුදලක් තෑගි ලෙස ලබා දුන්නා. එදා ඉඳලා ලිලී හා ආච්චි අම්මා හරි සතුටින් ජීවත් වුණා.

ලස්සන - ල - අ - පිල්ලමක් නැත. ලෑලිවලින් - ලෑ - ඈ - දික් ඇදපිල්ල.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

12. ඡේදය කියවා 'ත' අකුරෙන් පටන් ගන්නා වචන සහ ත අකුරට පිලි යෙදුණු වචන සොයා ලියන්න. ඒවායේ ශබ්ද සහ පිල්ලම නම් කරන්න.

මෙවර විනෝද චාරිකාව සඳහා ඔරුවක නැගී වටපිටාවේ සිරි නැරඹීමට අපි සිතුවෙමු. අපි ගමනට අවශ්‍ය දෑ සූදානම් කරගෙන තොටුපළ වෙත පියමං කළෙමු. ගං ඉවුර දෙපස තැනිතලාවේ ඇති උණ ගස්වල අතු සුළඟේ තාලයට සෙලවෙයි. සීත සුළඟේ තෙතමනය නිසා ගතට මහත් සිසිලසක් දැනෙයි. තොටුපළේ ඔරුව පදවාගෙන යන මාමාගේ උපදෙස් පරිදි අපි ඔරුවට ගොඩ වුණෙමු. ටික දුරක් ගමන් කරන අපට අවට පරිසරයේ චමත්කාරය වැඩි කරවන දසුන් දැකගත හැකි විය. සොබාදහම, අපට ලබා දුන් වටිනා තෑග්ගක් යැයි වරෙක සිතෙයි. ඈතින් පෙනෙන රබර් හා තේ වතු පරිසරයේ අලංකාරය තවත් වැඩි කරයි. ටික දුරක් ගිය අපට අලංකාර පැළ තවානක් ද දැක ගත හැකි විය. විවිධ තෘණ වර්ග එහි තිබෙන බව ඔරුව පදවන මාමා කීවේය. ඔරුව ඊළඟ තොටුපළ අසල නතර කර, අපි පැළ තවාන වෙත ගියෙමු. අපට අවශ්‍ය තෘණ වර්ග තෝරා ගැනීම අපහසු වූයේ එහි තෘණ වර්ග රාශියක් තිබූ නිසා ය. වටිනා ඖෂධ වන තිප්පිලි, කෝමාරිකා යායක් දක්නට ලැබුණි. කේශවර්ධන තෛලයක් වන කෝමාරිකා තෛලය නිපදවීම සඳහා ඒ ශාක වගා කරන බව පැළ තවාන් හිමියා පැවසුවේය. පැළ තවාන නැරඹූ අපි අවට සිරි නරඹා නැවත ඔරුවට ගොඩ වූයෙමු. තොටුපළ කරා ළඟාවන විට බොහෝ රෑ බෝ වී තිබුණි. අප නිවසට කැඳවාගෙන යාමට සීයා තිරික්කලය එවා තිබුණි. මීට පෙර තිරික්කලයේ නොගිය මට එය අලුත් අත්දැකීමක් විය. හඳයා තිරික්කලය ඇදගෙන ගිය වේගයට මම තිගැස්සී ගියෙමි.

තොටුපළ - තො - ඔ - කොම්බුව සහිත ඇලපිල්ල තෙතමනය - තෙ - එ - කොම්බුව.

13. ද, ව, ත, ල, යන අකුරු වලින් පටන් ගන්නා වචන යොදා වගුව සම්පූර්ණ කරන්න.

| ගැහැනු | පිරිමි | මල් | පලතුරු | සත්තු | ගම් |
|---|---|---|---|---|---|
| දම්මි | දහම් | දාස්පෙති | දිවුල් | දිමියා | දැරණියගල |
| | | | | | |
| | | | | | |
| | | | | | |

14. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| අනු අංකය | පිල්ලේ නම | පිලි | නියෝජනය වන ස්වරය | උදාහරණ |
|---|---|---|---|---|
| 01. | ඇලපිල්ල | | ආ | කා |
| 02. | කෙටි ඇදපිල්ල | ැ | | කැ |
| 03. | දික් ඇදපිල්ල | | ඈ | කෑ |
| 04. | කෙටි ඉස්පිල්ල | ි | ඉ | |
| 05. | දික් ඉස්පිල්ල | | ඊ | |
| 06. | කෙටි කොන් පාපිල්ල | ු | උ | ගු |
| 07. | කෙටි වක් පාපිල්ල | ු | | |
| 08. | කෙටි ඇද පාපිල්ල | | උ | රු |
| 09. | දික් කොන් පාපිල්ල | ූ | | ගූ |
| 10. | දික් වක් පාපිල්ල | ූ | ඌ | කූ |
| 11. | දික් ඇද පාපිල්ල | ෑ | ඌ | |
| 12. | කොම්බුව | ෙ | | කෙ |
| 13. | කොම්බුව සහිත හල් කිරීමේ ලකුණ | ෙ<br>ෙ ් | | කේ<br>වේ |
| 14. | කොම්බුව සහිත ඇලපිල්ල | | | කා |

| | | | | |
|---|---|---|---|---|
| (16.) | ගැටඇලපිල්ල | බ | සැ | |
| (17.) | ගැටඇලපිලි දෙක | | සෑ | කෑ |
| (18.) | කොම්බු දෙක | | වේ | |
| (19.) | කොම්බුව සහ ගයනුකිත්ත | ෙ ා | | කො |

14. නිවැරදි පිල්ලම් යෙදූ වචන යොදාගෙන පහත සඳහන් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.



පහළට

(1) "රස" යන්නෙහි විරුද්ධාර්ථවත් පදය

(2) රට වටා වැට බැන්දත් මෙය වටා වැට බැඳිය නොහැකි ය

(3) ධීවර කටයුතු සඳහා ප්‍රසිද්ධ නගරයකි

(7) කාන්තාව යන වචනයට සමානාර්ථවත් පදයකි

(9) උත්තම පුරුෂ ඒක වචන නාම පදයකි

හරහට

(2) වී වගාව හා සම්බන්ධ ස්ථානයකි

(4) මල්වාන ප්‍රදේශයේ වැවෙන රසවත් පලතුරකි

(5) සිංහල භාෂාවේ පද වර්ගයකි

(6) වහල සෙවිලි කිරීමට මෙය යොදා ගනී

(8) සිය යන්නට සමානාර්ථවත් පදයකි

15. නිවැරදි පිල්ලම් යෙදූ වචන අසා ලිවීම.

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

## විරාම ලකුණු හඳුන්වා දීම

- **තිත (.)** - නැවතීමේ ලකුණක් ලෙස යෙදීම.

..................................................................................................................................

..................................................................................................................................

- **ප්‍රශ්නාර්ථ ලකුණ (?)** - ප්‍රශ්න අසන වාක්‍යවල වාක්‍ය අවසානයේ යෙදීම.

..................................................................................................................................

..................................................................................................................................

- **කොමාව (,)** - වාක්‍යයක් අවසන් වීමට පෙර තබන විරාමය සඳහා මෙන්ම පද වෙන් කිරීම සඳහා යෙදීම.

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

- **යුගල උඩු කොමා (" ")** - යමකු විසින් කළ ප්‍රකාශයක්, යමකින් උපුටා ගැනීමක් පෙන්වීම සඳහා යෙදීම.

.......................................................................................................................................................

.......................................................................................................................................................

- **විස්මයාදි ලකුණ ( ! )**

1. විස්මයක් දැනවීමට යෙදීම.

.......................................................................................................................................................

2. ප්‍රාර්ථනයක් හැඟවීමට

.......................................................................................................................................................

2. සතුටක් දැනවීමට

.......................................................................................................................................................

4. ශෝකයක් හැඟවීමට

.......................................................................................................................................................

- **සරල වරහන් (   )** - ප්‍රකාශනයක යම් තැනක අර්ථය පැහැදිලි කිරීම සඳහා මෙන්ම අමතර තොරතුරක් දැක්වීම සඳහා යෙදීම.

.......................................................................................................................................................

.......................................................................................................................................................

13. පෙළපොත ඇසුරෙන් විරාම ලකුණු යෙදුනු වාක්‍ය සොයා ලියන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................